ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

## ඇමරිකානු ඩොලර් මිලියන 450ක ප්‍රතිසංස්කරණ පැකේජය යටතේ ඉන්දියාවෙන් ශ්‍රී ලංකාවට තවත් බේලි පාලම් තොගයක්

ඉන්දියාව විසින් මෙට්‍රික් ටොන් 251ක් පමණ බරැති බේලි පාලම් කට්ටලයක් 2026 අගෝස්තු 06 වන දින ශ්‍රී ලංකා රජයට භාර දෙන ලදී. මෙම තොගය ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් ශ්‍රී මෛත්‍රේය කුලකර්ණි මැතිතුමා විසින් සමූපාකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු උපාලි සමරසිංහ මැතිතුමා වෙත භාර දෙන ලදී.

2. මෙම බේලි පාලම් තොගය දිට්වා සුළි කුණාටුවෙන් අනතුරුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාව සඳහා නිවේදනය කරන ලද ඇමරිකානු ඩොලර් මිලියන 450ක නැවත ගොඩනැගීමේ සහ පුනරුත්ථාපන පැකේජයේ කොටසකි. මෙම පාලම් ඉන්දීය යුධ හමුදා ඉංජිනේරු කාර්ය සාධක බලකායක් විසින් මාර්ග සංවර්ධන අධිකාරිය සහ අදාළ පළාත් මාර්ග සංවර්ධන අධිකාරීන් විසින් හඳුනාගත්තා ස්ථානවල ස්ථාපනය කෙරෙනු ඇත.

3. සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශයන්හි අත්‍යවශ්‍ය මාර්ග සම්බන්ධතා ප්‍රතිෂ්ඨාපනය කරමින් ඉන්දියාව දැනටමත් ශ්‍රී ලංකාවේ ස්ථාන 7ක බේලි පාලම් 8ක් ස්ථාපනය කර ඇත. මෑතකදී ලබා දුන් මෙම තොගය ද පීඩාවට පත් ජනතාව සඳහා මාර්ග සම්බන්ධතා ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහ යටිතල පහසුකම් ශක්තිමත් කිරීමට තවදුරටත් දායක වනු ඇත.

4. නැවත ඉදිකිරීම් සඳහා ලබා දෙන සහයෝගයේ මීළඟ අදියර වශයෙන් ඉන්දියාව විසින් ශ්‍රී ලංකාව පුරා හඳුනාගත් ප්‍රදේශවල ස්ථාවර පාලම් ඉදි කිරීම ද අරඹනු ඇත. මෙම ව්‍යාපෘතීන් රට පුරා අත්‍යවශ්‍ය මාර්ග සම්බන්ධතා ශක්තිමත් කිරීමට සහ වඩා ඔරොත්තු දෙන යටිතල පහසුකම් ගොඩනැගීමට දායකත්වය ලබා දෙනු ඇත.

***

2026 අගෝස්තු 07
කොළඹ